
# ස්වභාවික ආපදාවලින් ආරක්ෂා වෙමු



*එෂිනි අංජානා ගුණවර්ධන*

# ස්වභාවික ආපදාවලින් ආරක්ෂා වෙමු

එෂිනි අංජානා ගුණවර්ධන

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

6 F

පලමුවන මුද්‍රණය 2025.02.08

ISBN – IS37217

# පිදුම

මා හට නිති ඔවදන් දෙමින් මා රැකබලා ගන්නා මාගේ ආදරණීය අනෝමා අත්තම්මාට පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

## ස්වභාවික ආපදා යනු කුමක්ද ?

ස්වාභාවික ආපදා යනු ස්වාභාවික ක්‍රියාවලි හේතුවෙන් මිනිසාට, දේපළවලට, සතුන්ට හා පරිසරයට හානි සිදුවිය හැකි සංසිද්ධි වේ.

උදා:

- සුළි සුළං
- ගංවතුර
- නාය යෑම්
- භූමිකම්පා
- ලැව් ගිනි
- සුනාමි තත්ත්වයන් .....වැනි දේ



# නාය යෑම්

- අධික වර්ෂා තත්ත්වයන් පවතින විට කඳු කොටස් කඩා වැටීම් , ගිලාබැසීම් ,ගල් පෙරළීම වැනි දෑ මෙයට අයත් වේ.

- මෙම නායං වලට මිනිස් ක්‍රියාකාරකම් ද හේතුවේ. ගස් කැපීම් අනවසර ඉදිකිරීම් වැනි දෑ.

- නාය යෑම්  වැළැක්වීමට අපට ගත හැකි පියවර ලෙස ගල්වැටි බැඳීම්, පිඩැලි ඇල්ලීම් , ගස් සිටුවීම වැනි දෑ කළ හැක. නාය යෑමකදී ඔබ කළ යුත්තේ හැකිතාක් එම ප්‍රදේශයෙන් ඉවත් වීමයි. ඒමෙන්ම නාය යන ප්‍රදේශයක ඔබ ජීවත් වන්නේ නම් අධික වර්ෂාව පවතින කාලවලදී කාලගුණ නිවේදන පිළිබඳ අවධානයෙන් සිටින්න.



# ගංවතුර

- අධික වර්ෂාව  හේතුවෙන් හා ගංගා පිටාර ගැලීම නිසා ගොඩබිම් ප්‍රදේශ ජලයෙන් යටවීම ගංවතුර නම් වේ.

- ගංවතුරකදී ඔබ කළ යුත්තේ උස්බිමකට ගමන් කිරීම, උඩ තට්ටුවකට නැගීම, වහලයක් මතට නැගීම හෝ ගසක් මතට නැග උදව් ඉල්ලීමයි.

- එමෙන්ම , ගංවතුරින් බෝවන රෝග පැතිරීමට හැකි නිසා හැකිතාක් එම ජලයෙන් ඈත්වීමට කටයුතු කරන්න.



# සුළි සුළං



- සාගරයේ සමහර තැන්වල අඩු පීඩන තත්ත්වයක් ඇති බැවින් එය තුලිත කිරීමට අවට ප්‍රදේශයෙන් අඩු පීඩන කලාපය වෙතට තද සුළං ධාරවක් ඉතා වේගයෙන් ඇදී යයි. කිලෝමීටර 100 ක් දක්වා පැතිර යා හැකි තද සුළං තත්ත්වයක් පවතින්නට පුළුවන්.

සුළි සුළං තත්ත්වයකදී අප ක්‍රියා කළ යුත්තේ කෙසේද?

- ඇතින් සුළඟේ හඬ ඇසෙන විටම අප එයට සූදානම් විය යුතුය. ළමුන් නිවසෙන් පිටතට නොයා යුතුය . නිවස ඇතුලට වී ආරක්ෂිතව සිටින්න.

- ජනෙල් දොරවල් වසා දැමීමට කටයුතු කරන්න. කලබල නොවී සන්සුන්ව සිටින්න.  ශක්තිමත් ගොඩනැගිල්ලක් තුළටද යා හැකිය. කඩා වැටීමට හැකි ගස්, ශක්තිමත් නැති ගොඩනැගිලි අසල සිටීමෙන් වළකින්න.

# අකුණු අනතුරු

- අකුණෙහි අධික  උෂ්ණත්වය නිසා විද්‍යුත් ධාරාව වටා තිබෙන වාතය ක්ෂණිකව ප්‍රසාරණය වීම අකුණු අනතුර ලෙස  හැඳින්වේ.

අකුණු අනතුරු වලින් අප ආරක්ෂා වන්නේ කෙසේද?

- අකුණු ගහන අවස්ථාවලදී එළිමහනේ ගස් යට සිටීමෙන් වළකින්න . එළිමහනේ දිය නාමින් සිටීමෙන් ද වළකින්න.  නිවස තුළට වී ආරක්ෂා වී සිටින්න. අප  එම අවස්ථාවේදී ජංගම දුරකථන හෝ පරිගණක , රූපවාහිනිය වැනි විදුලියෙන් ක්‍රියාත්මක වන උපකරණ භාවිතයෙන් වැළකිය යුතුයි.  රබර් සෙරෙප්පු වැනි දෑ පැළඳ සිටින්න.



# ලැව් ගිනි

- වනාන්තර ප්‍රදේශවල ස්වභාවිකව ඇතිවන ගිනි ගැනීම් ලැව් ගිනි ලෙස හැඳින්වේ. උෂ්ණත්වය අධික කාල වලදී මෙම ලැව් ගිනි තත්ත්ව බහුලව දක්නට ලැබේ.
- එය මුලින් මං පාලනය නොකළහොත් ඉතා විශාල ප්‍රදේශයක් විනාශ විය හැක.
- ලැව් ගිනි ඇති වූ බව දැන ගත හොත් ඔබ කළ යුත්තේ වැඩිහිටි කෙනෙකු දැනුවත් කර ඔවුන්ගේ මාර්ගයෙන් ගිනි නිවීමේ ඒකකය දැනුවත් කිරීමයි.

# භූමි කම්පා

- භූමි කම්පා යනු පෘථිවිය මත ඇතිවන චලනයන් වේ. එය ඇති වන්නේ පෘථිවි පෘෂ්ඨයේ ඇති ස්තරවල  ඇති වන චලනයන් නිසා බව සැලකේ. මුහුදු පතුලේ ඇතිවන භූ කම්පන නිසා සුනාමි තත්ත්ව ඇති විය හැක.

- භූමිකම්පාවකදී අප කළ යුත්තේ ඉතා ශක්තිමත් ගොඩනැගිල්ලක් තුළට වී සිටීම හෝ ගස් ,කණු නැති එළිමහන් බිමක රැදී සිටීමයි.

# සුනාමි තත්වයන්

- මුහුදු පතුලේ ඇතිවන භූ කම්පන හේතුවෙන් මුහුදු රළ කැළඹීම හේතු කරගෙන විශාල මුහුදු රළ ගොඩබිම තුළට කඩා වැදීම සුනාමි තත්වයක් ලෙස හැඳින්වේ. මෙම සුනාමි වචනය ජපන් භාෂාවේ වචනයකි.
- සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථාන මුහුදුබඩ ප්‍රදේශවල ස්ථාපිත කර ඇත.
- සුනාමි අනතුරු ඇඟවීමක් දැන් වූ පසු ඔබ කළ යුත්තේ හැකිතාක් රට මැදට ගමන් කිරීමයි. උස් බිම්, ශක්තිමත් උස් ගොඩනැගිලි මතට නැගීම ද සිදුකළ හැක.



# ගිනිකඳු පිපිරීම්



- පෘථිවිය තුළ පවතින  අධික උෂ්ණුසුම් ලාවා පෘථිවියේ පැළුම් අතරින් ඉහළට මතුවී කන්දක් තුළින් ඉහළට මතුවීම ගිනිකඳු පුපුරා යාමක් ලෙස හැඳින්වේ. ලෝකයේ සෑම තැනකම ගිනිකඳු පිහිටා නැත .යම් ස්ථානවල පමණක්  ගිනිකඳු පිහිටා තිබේ. ඒ අතරින් පිලිපීනය, අයිස්ලන්තය, ඉතාලිය හා ජපානය ගිනිකඳු බහුල රටවල් වේ. සමහර ගිනිකඳු සක්‍රීය වන්නේ අවුරුදු ගණනාවකට පසුවයි. ගිනිකන්දක් සක්‍රිය වූ විට හැකිතාක් එම ප්‍රදේශයෙන් ඉවතට  යාම සිදුකළ යුතුය.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්